**සණස සංවර්ධන බැංකුව පී එල් සී**
**26 වන වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව**

**දිනය** : 2023.05.19

**ස්ථානය** : "අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් ශාලාව", සණස සංවර්ධන බැංකුව, නො.12,එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06

**සහභාගිත්වය** : කොටස්හිමියන් (65 ZOOM තාක්ෂණය ඔස්සේ සහභාගී වූ)

01. බැංකුවේ 26 වන වාර්ෂික මහා සභා රැස්වීමේ කටයුතු පෙ.ව.10.00 ට අතථ්‍ය ක්‍රමයට (Online) ආරම්භ කරන ලද අතර, ආගම සිහි කිරීමෙන් අනතුරුව සමුපකාර ප්‍රතිඥාව කියවීම සිදු කරන ලදී.

02. සමස්ථ සණස ව්‍යාපාරයේ උන්නතිය වෙනුවෙන් කැපවුණු, මිය ගිය සමුපකාරිකයින් සහ සණස සංවර්ධන බැංකුවෙහි මිය ගිය අධ්‍යක්ෂවරුන් සිහි කරමින් විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කරන ලදී.

03. සණස සංවර්ධන බැංකුවෙහි සභාපතිතුමිය විසින් සභාව අමතා පැමිණ සිටි සියළු දෙනාම උණුසුම් ලෙස පිළිගනිමින් 26 වන වාර්ෂික මහා සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

04. සමාගම් ලේකම් ටාමරිකා රොද්‍රිගු මහත්මිය විසින් රැස්වීම පිළිබඳ නිවේදනය කියවන ලදී.

05. පසුගිය වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තා සම්මත කිරීම.

2022.05.30 දින පැවති 25 වන වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

06. බැංකුවේ සභාපතිතුමිය විසින් 2022 මූල්‍ය වර්ෂය පිළිබඳව කොටස්හිමියන් වෙත කෙටි පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

**07. සාමාන්‍ය යෝජනා**

**7.1. 2022.12.31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම, ශේෂ පත්‍රය, අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව හා විගණකවරුන්ගේ වාර්තාව සභා සම්මත කිරීම.**

2022.12.31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා බැංකුවෙහි විගණකවරුන් වන අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් සමාගමෙහි සාමාජිකයින් විසින් විගණන වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

2022.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම, ශේෂ පත්‍රය, අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව හා විගණකවරුන්ගේ වාර්තාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

## 7.2. අධ්‍යක්ෂවරුන් නැවත පත් කිරීම.

26 වන වාර්ෂික මහා සභාවේදී, අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු නැවත පත් කර ගැනීම සඳහා කොටස්හිමියන් විසින් පහත නම් ඉදිරිපත් කර ඇති බව සමාගම් ලේකම් විසින් කොටස්හිමියන් වෙත දන්වා සිටින ලදී.

- සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(i) වගන්තිය ප්‍රකාරව කාර්ය මාරු ක්‍රමයට 26 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යන එලායන්ස් ෆිනෑන්ස් කම්පනි පී එල් සී නියෝජනය කරනු ලබන රොමානි ද සිල්වා මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත පත් කිරීම.
- සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(i) වගන්තිය ප්‍රකාරව කාර්ය මාරු ක්‍රමයට 26 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යන සී/ස සණස මහා සංගමය නියෝජනය කරනු ලබන සරත් නන්දසිරි මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත පත් කිරීම.
- සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනියම් පුරප්පාඩුවක් (Casual Vacancy) පිරවීම සඳහා පත් කරන ලද ආචාර්ය මහේෂ රණසෝම මහතා, බැංකුවේ සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(ii) වගන්තිය ප්‍රකාරව 26 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී, සී/ස අයෙන්කා හෝල්ඩිංග්ස් පුද්ගලික සමාගම නියෝජනය කරමින් අධ්‍යක්ෂවරයකු ලෙස නැවත පත් කිරීම.

### 7.2.1. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(i) වගන්තිය ප්‍රකාරව කාර්ය මාරු ක්‍රමයට 26 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යන එලායන්ස් ෆිනෑන්ස් කම්පනි පී එල් සී නියෝජනය කරනු ලබන රොමානි ද සිල්වා මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත පත් කිරීම.

රොමානි ද සිල්වා මහතා ඡන්ද 85,608,972 (92%) ක් ලබා ගනිමින් බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නැවතත් තේරී පත් වූ බව බැංකුවෙහි සමාගම් ලේකම් විසින් කොටස්හිමියන් වෙත දන්වා සිටින ලදී.

තවද රොමානි ද සිල්වා මහතා අධ්‍යක්ෂවරයෙකු වශයෙන් නැවත පත් කිරීමේ යෝජනාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

### 7.2.2. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(i) වගන්තිය ප්‍රකාරව කාර්ය මාරු ක්‍රමයට 26 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යන සී/ස සණස මහා සංගමය නියෝජනය කරනු ලබන සරත් නන්දසිරි මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත පත් කිරීම.

සරත් නන්දසිරි මහතා ඡන්ද 91,520,480 (98%) ක් ලබා ගනිමින් බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා තේරී පත් වූ බව බැංකුවෙහි සමාගම් ලේකම් විසින් කොටස්හිමියන් වෙත දන්වා සිටින ලදී.

තවද සරත් නන්දසිරි මහතා අධ්‍යක්ෂවරයෙකු වශයෙන් නැවත පත් කිරීමේ යෝජනාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**7.2.3. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනියම් පුරප්පාඩුවක් (Casual Vacancy) පිරවීම සඳහා පත් කරන ලද ආචාර්ය මහේෂ රණසෝම මහතා, බැංකුවේ සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(ii) වගන්තිය ප්‍රකාරව 26 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී, සී/ස අයෙන්කා හෝල්ඩිංග්ස් පුද්ගලික සමාගම නියෝජනය කරමින් අධ්‍යක්ෂවරයකු ලෙස නැවත පත් කිරීම.**

ආචාර්ය මහේෂ රණසෝම මහතා ඡන්ද 85,608,432 (92%) ක් ලබා ගනිමින් බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා තේරී පත් වූ බව බැංකුවෙහි සමාගම් ලේකම් විසින් කොටස්හිමියන් වෙත දන්වා සිටින ලදී.

තවද ආචාර්ය මහේෂ රණසෝම මහතා අධ්‍යක්ෂවරයෙකු වශයෙන් නැවත පත් කිරීමේ යෝජනාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**7.3. 2023 වර්ෂය සඳහා විගණකවරුන් වශයෙන් අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරී ආයතනය තෝරා පත් කර ගැනීම සහ ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් තීරණය කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරීම.**

2023 වර්ෂය සඳහා බැංකුවෙහි විගණකවරුන් වශයෙන් අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් සමාගම නැවත පත් කිරීම සලකා බැලීම සහ ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පැවරීම සම්බන්ධ යෝජනාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**7.4. 2023 වර්ෂය සඳහා ප්‍රදානයන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරීම.**

2023 වර්ෂය සඳහා ප්‍රදානයන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරීම සම්බන්ධ යෝජනාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**08. කොටස්හිමියන්ගේ විමසීම්**

කොටස්හිමියන් විසින් කිසිඳු ගැටළුවක් ඉදිරිපත් නොකරන ලදී.

**09. ස්තූතිය හා සමාප්තිය**

26 වන වාර්ෂික මහා සභා රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් සභාපතිතුමිය විසින් සියලු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කල අතර, පෙරවරු 11.00 ට පමණ මෙම වාර්ෂික මහා සභා රැස්වීමේ සියළු වැඩ කටයුතු සමාප්ත විය.

ටාමරිකා රොද්‍රිගු
සමාගම් ලේකම්
2023.05.19